# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම 2025

## බුද්ධ ධර්මය

**10 ශ්‍රේණිය**

විභාග අංකය ......................

**කාලය - පැය 03**

පොදු උපදෙස්

- ★ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- ★ **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ x ලකුණ යොදන්න**

### I කොටස

(1) බෝසත් උපත සඳහා දේව ආරාධනාව ලැබූ පසු බෝසත්වරයකු විසින් ඒ සඳහා පූර්ව අධ්‍යයනයක් කරනු ලැබීම හඳුන්වන්නේ,
(i) පංච මහා විලෝකනය යි. (ii) උදාන වාක්‍ය ප්‍රකාශ කිරීම යි.
(iii) සිංහ නාදය පැවැත්වීම යි. (iv) මනුස්ස ලොවට වැඩම කිරීම යි.

(2) "මෙවන් පුතෙකු ලද මවක් නිවුණෝ වෙති" යන්න බෝසත් කුමරුට ප්‍රකාශ කරනු ලැබුවේ,
(i) යසෝදරා කුල කුමරිය යි. (ii) රූපනන්දා කුල කුමරිය යි.
(iii) කිසාගෝතමී කුල කුමරිය යි. (iv) ජනපද කල්‍යාණී කුල කුමරිය යි.

(3) සිදුහත් බෝසත් කුමරුට ශිල්ප ලබාදුන් බමුණු පඬිවරයා වන්නේ,
(i) අසිත කාලදේවල තුමා (ii) සර්වමිත්‍ර පඬිතුමා
(iii) දිසාපාමොක් ඇදුරු තුමා (iv) ආලාරකාලාම තවුසා

(4) බුදුරජාණන් වහන්සේ විසින් ගොඩනඟන ලද භික්ෂු සමාජය ආරම්භ කරන ලද්දේ,
(i) යසකුල පුත්‍රයා ඇතුළු පිරිස පැවිදි කිරීමෙනි. (ii) උපතිස්ස හා කෝලිත පැවිදි කිරීමෙනි.
(iii) තුන් බෑ ජටිලයන් පැවිදි කිරීමෙනි. (iv) පස්වග තවුසන් පැවිදි කිරීමෙනි.

(5) ගිහියා විසින් භික්ෂූන් වහන්සේ සඳහා පූජා කරනු ලබන සිව් පසයට අයත් නොවන්නේ,
(i) චීවරය (ii) පිණ්ඩපාත (iii) ධර්ම ග්‍රන්ථ (iv) ගිලන්පස

(6) පහත ගුණ අතරින් නව අරහාදි බුදුගුණ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
(i) අරහං ගුණය සහ අකාලික ගුණය (ii) සුගත ගුණය සහ ලෝකවිදූ ගුණය
(iii) ඕපනයිකෝ ගුණය සහ භගවාගුණය (iv) අරහං ගුණය සහ සුපටිපන්න ගුණය

(7) "රහසත් පව් නොකොට "යන කවිය ඇතුලත් ග්‍රන්ථය වන්නේ,
(i) ලෝවැඩ සඟරාව යි. (ii) බුදුගුණ අලංකාරය යි. (iii) සුභාෂිතය යි. (iv) සිරිත් මල්දම යි.

(8) මහා සංඝරත්නය මනා වූ පිළිවෙත් පුරන නිසා..
(i) සුපටිපන්න නම් වේ. (ii) උජුපටිපන්න නම් වේ.
(iii) ආහුනෙයියෝ නම් වේ. (iv) පාහුනෙයියෝ නම් වේ.

(9) මිනිස් සිත කිළිටි කරන කුසල් සිත්වලට බාධා කරන සිතුවිලි දහමේ දැක්වෙන්නේ කුමන නමින්ද?
(i) අකුසල කර්ම (ii) පාරමිතා (iii) අසාදු චර්යා (iv) නීවරණ

(10) රත් වී උතුරන බුබුළු නැගෙන ජලයට උපමා කර ඇති නීවරණය වන්නේ කුමක්ද?
(i) කාමච්ඡන්ද (ii) ව්‍යාපාද (iii) ථීනමිද්ධ (iv) විචිකිච්චා

(11) සුදුසු කමටහනක් නොලබා තමාගේ අභිමතය පරිදි සාරමසක් මුළුල්ලේ භාවනා කොට ප්‍රතිඵල නොලැබූ භික්ෂූන් වහන්සේ වන්නේ,
(i) සැරියුත් තෙරණුවන් ය. (ii) ස්වර්ණකාර තෙරණුවන් ය.
(iii) චන්න තෙරණුවන් ය. (iv) මුගලන් තෙරණුවන් ය.

(12) මිනිසා රෝග පීඩාවන්ට ලක්වීම බුදු දහමේ හඳුන්වනු ලබන්නේ කුමන නමින්ද?
(i) ජාති (ii) ව්‍යාධි (iii) ජරා (iv) මරණ

(13) මිනිසාගේ සිත් තුළ උපදින සටහන් නිමිති බුදුදහමේ හඳුන්වනු ලබන්නේ,
(i) රූප ස්කන්ධය ලෙසයි. (ii) සඤ්ඤා ස්කන්ධය ලෙසයි.
(iii) වේදනා ස්කන්ධයය ලෙසයි. (iv) සංඛාර ස්කන්ධය ලෙසයි.

(14) තිලකුණු දන්නා තැනැත්තා අටලෝ දහමින් කම්පා නොවනු ඇත. එම අටලෝ දහමට අයත් නොවන්නේ,
(i) ලෝභය යි. (ii) නින්දාව යි. (iii) අලාභය යි. (iv) අයස යි.

(15) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ හිමිපාණන් වහන්සේ ලක්දිව පහළ වූයේ,
(i) අනුරාධපුර යුගයේදී ය. (ii) ගම්පොළ යුගයේදී ය.
(iii) පොළොන්නරුව යුගයේදී ය. (iv) මහනුවර යුගයේදී ය.

(16) කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ සරණංකර හිමිගේ මූලිකත්වයෙන් ලංකාවට උපසම්පදාව ගෙන එන ලැබූ රට කුමක්ද?
(i) මියන්මාරය (ii) ජපානය (iii) තායිලන්තය (iv) චීනය

(17) දුටුගැමුණු මහරජතුමා තම රාජ්‍ය පාලන කාලය තුළ පැවැත් වූ වෙසක් උත්සව ගණන කීයද?
(i) විසි හතරකි. (ii) විසිපහකි. (iii) විසි හයකි. (iv) විසි හතකි.

(18) බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය වන ධම්මපදය අයත් වන්නේ,
(i) සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට යි. (ii) සූත්‍ර පිටකයේ අංගුත්තර නිකායට යි.
(iii) සූත්‍ර පිටකයේ සංයුක්ත නිකායට යි. (iv) සූත්‍ර පිටකයේ දීඝ නිකායට යි.

(19) දැහැමිව ජීවත්වීම,මිත්‍යා දිවිපැවැත්මෙන් තොරව යහපත් ජීවිකාවකින් යුක්ත වීම හැඳින්විය හැකි පදය වන්නේ,
(i) සුචිකම්ම (ii) ධම්මජීවි (iii) සතිමතෝ (iv) නිසම්මකාරී

(20) මරණාසන්න මොහොතේදී සුගතියම දැක සිහියෙන් යුතුව කළුරිය කරන ලද්දේ,
(i) ධම්මික උපාසකතුමා ය. (ii) චුන්ද සූකිරික ය.
(iii) කෝසල මල්ලිකා බිසව ය. (iv) උපක ආජීවක තුමා ය.

(21) පංචසීලය ආරක්ෂා කරන්නා සුරකින මානව අයිතිවාසිකමක් නොවන්නේ,
(i) අන් අයගේ ජීවත්වීමේ අයිතිය (ii) සන්නිවේදන අයිතිය
(iii) අන් අයගේ දේපළ අයිතිය (iv) ව්‍යාපාර කිරීමේ අයිතිය

(22) කළ යුතු දේ කිරීම බුදු දහමේ හඳුන්වනු ලබන්නේ,
(i) විරමණ ලෙසයි. (ii) වාරිත්‍ර ලෙසයි. (iii) සමාදාන ලෙසයි. (iv) චාරිත් ලෙසයි.

(23) සදිසා නමස්කාරය පිළිබඳ පැවසෙන සූත්‍ර දේශනාව වන්නේ,
(i) සිගාලෝවාද සූත්‍රය යි. (ii) ව්‍යග්ගපජ්ජ සූත්‍රය යි.
(iii) මහා මංගල සූත්‍රය යි. (iv) රතන සූත්‍රය යි.

(24) බුදුන් වහන්සේ සිගාලක ගෘහපුත්‍රයාට දේශනා කළ පරිදි බටහිර දිසාවෙන් පෙන්නුම් කරන්නේ,
(i) මවුපියන් (ii) ස්වාමි භාර්යාවන් (iii) ගුරුවරුන් (iv) හිතමිතුරන්

(25) "සෑම කටයුත්තකම දක්ෂ වීම හා අනලස් වීම" කාගේ යුතුකමක් ලෙස සිගාලෝවාද සූත්‍රයෙහි දක්වා තිබේද?
(i) ශිෂ්‍යයාගේ යුතුකමකි. (ii) බිරිඳගේ යුතුකමකි.
(iii) සැමියාගේ යුතුකමකි. (iv) සේවකයාගේ යුතුකමකි.

(26) "ඔබ දෙවියෙක්ද ,ගාන්ධර්වයෙක්ද, යක්ෂයෙක්ද, මනුස්සයෙක්ද යනුවෙන් බුදුන් වහන්සේගෙන් විමසා සිටියේ,
(i) ද්‍රෝණ නම් බමුණා ය. (ii) සෝණ දණ්ඩ නම් බමුණා ය.
(iii) සෝණ බමුණා ය. (iv) සකුළුදායි බමුණා ය.

(27) අපි වෛර කරන්නවුන් අතර අවෛරීව සුවසේ වාසය කරමු. යන අර්ථයට අදාළ ධම්මපද ගාථාවේ මුල් පදය වන්නේ,
(i) අචරිත්වා බ්‍රහ්මචරියං.. (ii) නහි වේරේන වේරාණි..
(iii) උට්ඨානවතෝ සතිමතෝ..... (iv) සුසුඛං වත ජීවාම...

(28) ”සමග්ගා හෝථ මා විවදථ” යන්නෙහි අර්ථය වන්නේ,

(i) ”සමගියම යහපතී” යන්න යි. (ii) ”සමගි වී සන්සුන් වන්න” යන්න යි.

(iii) ”සමගි වන්න විවාද කරන්න” යන්න යි. (iv) ”සමගි වන්න විවාද නොකරන්න” යන්න යි.

(29) සාමයෙන් සමගියෙන් සහයෝගයෙන් ජීවත්වීම බුදු දහමේ හඳුන්වනු ලබන්නේ කුමන නමින්ද?

(i) සමාදානය යන නමිනි. (ii) අත්තූපනායක ධර්ම පරියාය නමිනි.

(iii) සහජීවනය නමිනි. (iv) සහයෝගය නමිනි.

(30) වචනයෙන් සිදුවන සචේතනික අකුසල ක්‍රියා හඳුන්වනු ලබන්නේ,

(i) අකුසල කාය කම්ම නමිනි. (ii) අකුසල මනෝකම්ම නමිනි.

(iii) අකුසල වචීකම්ම නමිනි. (iv) වාචසික සුචරිත නමිනි.

(31) මනසින් සිදුවන අකුසල කර්මයක් වන්නේ,

(i) අභිද්‍යාව (ii) අදත්තා දානය (iii) ප්‍රාණඝාතය (iv) කාම මිථ්‍යාචාරය

(32) විපාක දෙන කාලය අනුව මෙලොවදීම විපාක දෙන කර්මය හඳුන්වන්නේ කුමන නමින්ද?

(i) දිට්ඨධම්ම වේදනීය කර්ම නමින් (ii) අපරාපරිය වේදනීය කර්ම නමින්

(iii) උපපජ්ජ වේදනීය කර්ම නමින් (iv) අහෝසි කර්ම නමින්

(33) රූපය පෙණපිඩකට උපමා කරන බුදු දහම වේදනාව උපමා කරනු ලබන්නේ,

(i) මිරිඟුවකට ය. (ii) දියබුබුලකට ය. (iii) කෙසෙල් කඳකට ය. (iv) මායාවකට ය.

(34) පඨවි, ආපෝ ,තේජෝ හා වායෝ යනුවෙන් ධර්මයේ හඳුන්වා ඇත්තේ,

(i) සතර කර්ම ක්ලේශ ය. (ii) සතර සංග්‍රහවස්තු ය.

(iii) සතර අගති ය. (iv) සතර මහා භූත රූප ය.

(35) උපතිස්ස පිරිවැජියාට ‘යේ ධම්මා හේතුප්පභවා’ යන ගාථාව දේශනා කරනු ලැබුවේ,

(i) කොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේ විසිනි. (ii) වප්ප මහරහතන් වහන්සේ විසිනි.

(iii). අස්සජි මහරහතන් වහන්සේ විසිනි. (iv) භද්දිය මහරහතන් වහන්සේ විසිනි.

(36) පටිච්ච සමුප්පාද යන යෙදුමෙන් කියවෙන්නේ සියල්ලේ පවත්නා,

(i) සහේතුක බව යි. (ii) අනිත්‍යය බව යි.

(iii) අහේතුක බව යි. (iv) සදාකාලික බවයි.

(37) ඉමස්මිං සති ඉදං හෝති... යන්නෙහි අර්ථය වන්නේ,

(i) මෙය ඇති කල්හි මෙය වෙයි යන්නයි. (ii) මෙය ඉපදීමෙන් මෙය උපදී යන්නයි.

(iii) මෙය නැති කල්හි මෙය නොවේ යන්නයි. (iv) මෙය නැතිවී යාමෙන් මෙය නැතිව යයි යන්නයි.

(38) තථාගතයන් වහන්සේ අවබෝධ කරගත් සිව්සස් ධර්මය නමින් හඳුන්වන්නේ,

(i) චතුරාර්ය සත්‍යය යි. (ii) සතර බ්‍රහ්ම විහරණය යි.

(iii) ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. (iv) සතර මාර්ග ඵල යන්න යි.

(39) බුදුන් වහන්සේ ලෝක සත්වයාට ධර්ම ප්‍රචාරයෙහි නියැළුණු වසර ගණන වන්නේ,

(i) වසර 29 කි. (ii) වසර 35 කි. (iii) වසර 45 කි. (iv) වසර 80 කි.

(40) තණ්හාවේ ප්‍රධාන ප්‍රභේද තුන වන්නේ,

(i) කාම,භව ,විභව (ii) රාග ,ද්වේශ ,මෝහ

(iii) අලෝභ, අද්වේෂ ,අමෝහ (iv) අනිත්‍ය ,දුක්ඛ, අනාත්ම

## II කොටස

★ මෙම ප්‍රශ්න පත්‍රයෙහි පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය.

---

1)

(i) පංච මහා විලෝකන අතරින් දෙකක් ලියන්න.

(ii) බෝසත් උපතේ දක්නට ලැබුණු ආශ්චර්යමත් සිදුවීම් දෙකක් ලියන්න.

(iii) අරහං බුදු ගුණය කෙටියෙන් හඳුන්වන්න.

(iv) බෞද්ධ භාවනාවේ දෙයාකාරය දක්වන්න.

(v) "චිත්තං සමේතීති සමථෝ" යන්නෙහි අර්ථය ලියන්න.

(vi) සතර බ්‍රහ්ම විහරණවලින් දෙකක් නම් කරන්න.

(vii) වැලිවිට සරණංකර හිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(viii) තමා විසින් කරන ලද සියලු යහපත් ක්‍රියා පින් පොතක ලියන ලද රජතුමා කවුද?

(ix) දස අකුසල් අතරින් වචනයෙන් සිදුවන අකුසල් දෙකක් ලියා දක්වන්න.

(x) සදිසා නමස්කාරයට අනුව මව්පියන් සහ ගුරුවරුන් පෙන්වා දෙන දිසා දෙක පිළිවෙළින් ලියන්න.

(ලකුණු 2 බැගින් 20යි)

2)

(i) සිදුහත් කුමරු කුඩා කළ ඉගෙන ගත් ශිල්ප දෙකක් නම් කරන්න. (ලකුණු 2යි)

(ii) "රාහුලයෙක් උපන්නා ගිහිගෙයි බන්ධනයක් ඇතිවිය" යන්න පාලියෙන් ලියන්න. (ලකුණු 3යි)

(iii) බෝසතාණන් වහන්සේ ජයගත් අභියෝග හා ඒවා ජයගත් ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 5යි)

3)

(i) බුදු දහමට අනුව භාවනාව යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2යි)

(ii) සීලයෙන් යුතුව සමාධි භාවනාව සඳහා යොමු වන පුද්ගලයා තුළ තිබිය යුතු ගුණාංග තුන දක්වන්න. (ලකුණු 3යි)

(iii) භාවනාවෙන් දෛනික ජීවිතයට ලැබිය හැකි ප්‍රයෝජන පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 5යි)

4)

(i) උට්ඨානවතෝ සතිමතෝ-සුචිකම්මස්ස නිසම්මකාරිනෝ..... යන ධම්මපද ගාථාවෙහි ඉතිරි පද දෙක ලියා දක්වන්න. (ලකුණු 2යි)

(ii) ඉහත ගාථාවෙහි අර්ථය ලියා දක්වන්න. (ලකුණු 3යි)

(iii) මෙම ගාථාව තුළින් පුද්ගල යසස වැඩෙන කරුණු හතක් පෙන්වා දෙයි. ඒ පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න. (ලකුණු 5යි)

5)

(i) කර්මය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2යි)

(ii) අකුසල මූල තුන නම් කරන්න. (ලකුණු 3යි)

(iii) අකුසල කර්මවලින් වැළකී කුසල කර්මවල යෙදීමේ වැදගත්කම ධර්මානුකූලව පෙන්වා දෙන්න. (ලකුණු 5යි)

6)

(i) චතුරාර්ය සත්‍ය අතරින් දෙකක් නම් කරන්න. (ලකුණු 2යි)

(ii) සසර දුක තුන් ආකාර වේ. ඒවා මොනවාද? (ලකුණු 3යි)

(iii) ගැටලුවක් විසඳා ගැනීමේ දී චතුරාර්ය සත්‍යය උපයෝගී කරගත යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 5යි)

7) පහත මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) බුදුරදුන්ගේ පද්මාකාර ජීවිතය (ii) සහජීවනය

(iii) දුටුගැමුණු රජතුමා (iv) ත්‍රිලක්ෂණය

(එක මාතෘකාවට ලකුණු 5 බැගින් ලකුණු 10යි)